**විශේෂ මහසභා වාර්තාව**

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2026.03.17 |
| වේලාව | :- | පෙ.ව. 9.30 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ර්.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
16. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
17. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
18. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
19. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
20. පී.ජී.මල්ලිකා මැතිතුමිය
21. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
22. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
23. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
24. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
25. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
26. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
27. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
28. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
29. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
30. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

**<u>2026.03.17 දින පැවැත්වීමට නියමිත රඹුක්කන ප්‍රාදේශීය සභා විශේෂ මහසභා රැස්වීමේ න්‍යාය පත්‍රය</u>**

(අ). සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා

(ආ). යථාපරිදි කල්දී ඇති යෝජනා

**(අ). සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියගේ නිවාඩු ලබා ගැනීම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනීප බැවින් 2026.03.17 දින පැවැත්වෙන විශේෂ මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.03.17 දින පැවැත්වෙන විශේෂ මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමියට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

ii. අනතුරකට ලක්ව ඇති බැවින් 2026.03.17 දින පැවැත්වෙන විශේෂ මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2026.03.17 දින පැවැත්වෙන විශේෂ මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා තෙල් පෝලිමේ සිටින බැවින් ප්‍රමාදවී සහභාගී වන බව ප්‍රකාශ කරන ලදී,

**(ආ).01.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. 2026.03.04 දින පැවති මාසික මහසභා රැස්වීමේ දී කල්තබන ලද (ඊ).01.I.xi යෝජනාව වන අංක CLG/LG – 5/3/1 – (iv වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය පරිදි රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළෙඳපළ,නව පළමු හා දෙවන වෙළෙඳපළ සංකීර්ණ වල ලේඛනගත මුල්බදුකරු විසින් අතුරු බදු දී ඇති කඩ කාමර වල අතුරු බදුකරුවන් නියමානුකූල කිරීමටත්, ගිවිසුම් ගත වන කාලසීමාව උපරිමය වර්ෂ 30කට යටත්ව තීරණ කිරීමටත් ඇමුණුමේ සඳහන් පරිදි අතුරු බදුකරුවන්ගෙන් අයකළ යුතු 25 % මුදල තීරණය කිරීමටත් මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවන ලද අංක CLG/LG-5/3/1-(IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව අතුරු බදු ලබා දී ඇති දේපළ නියමානුකූල කිරීම සඳහා මාස 03ක සහන කාලයක් ගරු ආණ්ඩුකාරතුමිය විසින් ලබා දී ඇති බැවින් ඇමුණුමෙහි සඳහන් සභාව සතු අතුරු බදු ලබාගෙන ඇති කඩ කාමර වලින් ලබාගත යුතු පෙර ගෙවුම් මුදල හා ගිවිසුම් ගත විය යුතු උපරිම කාලය තීරණය කළ යුතු බවත්, විශේෂයෙන් ඒ ඒ කඩ කාමර සම්බන්ධයෙන් ලිපිගොනු අධ්‍යනය කළ යුතු බැවින් කාරක සභා අවස්ථාවකට යාම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

➢ **කාරක සභා අවස්ථාව**

ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවකට යාම සුදුසු බව යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් විශේෂ මහසභා අවස්ථාවකට යාම සුදුසු බව යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

➢ **විශේෂ මහසභා අවස්ථාව**

1. **පොදු වෙළඳපල - 1 වන අදියරය - අංක 3 කඩ කාමරය**

2013 වර්ෂයේ එළඹි ගිවිසුම නිත්‍යානුකුල නම් දීර්ඝකාලීන බදු ගිවිසුමක් හා පෙර ගෙවුම් මුදලක් නොමැති බැවින් 2026 වර්ෂයේ මාසික කඩ කුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක මූල්‍ය වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 16 ක කාලයකට බදු දීමත් සුදුසු බව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය :-**

- **පොදු වෙළඳපල - 1 වන අදියර - අංක 3 කඩ කාමරය**

දීර්ඝකාලීන බදු ගිවිසුමක් හා පෙර ගෙවුම් මුදලක් නොමැති බැවින් 2026 වර්ෂයේ මාසික කඩ කුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක මූල්‍ය වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, 2013 වර්ෂයේ බදු ගිවිසුම අනුව වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 16 ක කාලයකට බදු දීමටත් තීරණය විය.

2. **පොදු වෙළඳපල - 1 වන අදියර - 25 කඩ කාමරය**

2014 වර්ෂයේ එළඹි ගිවිසුම නිත්‍යානුකුල නම් දීර්ඝකාලීන බදු ගිවිසුමක් හා පෙර ගෙවුම් මුදලක් නොමැති බැවින් 2026 වර්ෂයේ මාසික කඩ කුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක මූල්‍ය වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 17 ක කාලයකට බදු දීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය :-**

- **පොදු වෙළඳපල - 1 වන අදියර - 25 කඩ කාමරය**

දීර්ඝකාලීන බදු ගිවිසුමක් හා පෙර ගෙවුම් මුදලක් නොමැති බැවින් 2026 වර්ෂයේ මාසික කඩ කුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක මූලා වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, 2014 වර්ෂයේ බදු ගිවිසුම අනුව වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 17 ක කාලයකට බදු දීමටත් තීරණය විය.

- පෙ:ව 11.50ට කේ.සී.සරත් කුමාර මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

**3. පොදු වෙළෙපළ 1 වන අදියර - අංක 30 කඩ කාමරය**

1989 සිට ගිවිසුමක් නොමැතිව හා පෙර ගෙවුම් මුදලක් නොමැතිව කඩකාමරය භාවිතා කර ඇති බැවිනුත්, නව තක්සේරු මුදල අඩු බැවිනුත් 2026 වර්ෂයේ මාසික කඩකුලී තක්සේරුවමෙන් වසර 10 ක මුදල පෙර ගෙවුම් මුදල ලෙස ගැනීමටත්, 2026.03.31 දින සිට ඉදිරි වසර 20ක උපරිම කාලයකට යටත්ව බදු දීම සුදුසු බව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය :-**

- **පොදු වෙළෙපළ 1 වන අදියර - අංක 30 කඩ කාමරය**

1989 සිට ගිවිසුමක් නොමැතිව හා පෙර ගෙවුම් මුදලක් නොමැතිව කඩකාමරය භාවිතා කර ඇති බැවිනුත්, නව තක්සේරු මුදල අඩු බැවිනුත් 2026 වර්ෂයේ මාසික කඩකුලී තක්සේරුවමෙන් වසර 10 ක මුදල පෙර ගෙවුම් මුදල ලෙස ගැනීමටත්, 2026.03.31 දින සිට ඉදිරි වසර 20ක උපරිම කාලයකට යටත්ව බදු දීමටත් තීරණය විය.

- **කාරක සභා අවස්ථාව**

ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවකට යාම සුදුසු බව යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ප:ව 12.17ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් විශේෂ මහසභා අවස්ථාවකට යාම සුදුසු බව යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **විශේෂ මහසභා අවස්ථාව**

**4. අනු අංක 04 සිට 18 දක්වා කඩකාමර සම්බන්ධව**

පෙර ගෙවුම් මුදලක් ලබාගෙන ඇති නමුත් දීර්ඝකාලීනව බදු ගිවිසුමක් ලෙස වාර්ෂික බදු ගිවිසුම් ලබාගෙන ඇති පහත කඩකාමර වලින් පෙර ගෙවුම් මුදලින් 25%ක අගය හා 2026 වර්ෂයේ මාසික කඩකුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක අගය යන දෙකෙන් වැඩි වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, ගිවිසුම්ගත කාලය පදනම්ව වසර 30 ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර සඳහා බදු දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ප:ව 12.20ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජ්.සුසාන්ත විමලරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය සභා ගර්භයෙන් ඉවත්ව යන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය :-**

- **අනු අංක 04 සිට 18 දක්වා කඩකාමර සම්බන්ධව.**

පෙර ගෙවුම් මුදලක් ලබාගෙන ඇති නමුත් දීර්ඝකාලීනව බදු ගිවිසුමක් ලෙස වාර්ෂික බදු ගිවිසුම් ලබාගෙන ඇති පහත කඩකාමර වලින් පෙර ගෙවුම් මුදලින් 25%ක අගය හා 2026 වර්ෂයේ මාසික කඩකුලී තක්සේරු මුදල මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක අගය යන දෙකෙන් වැඩි වටිනාකම පෙර ගෙවුම් මුදල (key maney) ලෙස ගැනීමටත්, වසර 30 ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර සඳහා බදු දීමටත් තීරණය විය.

(ඇමුණුම)

| අනු අංකය | කඩ කාමර අංකය | මුල් බදුකරුගේ නම | ගිවිසුම්ගත දිනය | ගිවිසුම් කාලය | පෙර ගෙවුම් මුදල (රු.) (ලේඛනගත) | පෙර ගෙවුම් මුදලින් 25% මුදල (රු.) | 2026 වර්ෂයේ මාසික තක්සේරුව | 2026 වර්ෂයේ මාසික තක්සේරු මුදලින් 25% මුදල (රු.) | විශේෂ මහ සභා තීරණය අනුව ලබා ගත යුතු පෙර ගෙවුම් මුදල (රු.) | විශේෂ මහ සභා තීරණය අනුව ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | පොදු වෙළඳපල- 1 වන අදියර- අංක 3 | අයි.එල්.අමීර්දීන් මයා | 2013.09.04 | වාර්ෂිකව | මාසිකව 900.00 | 27,000.00 | 5,700.00 | 171,000.00 | 171,000.00 | 2043.09.03 |
| 2 | පොදු වෙළඳපල- 1 වන අදියර- 25 | එම්.එස්.එම්.නියාස් මයා | 2014.07.28 | වාර්ෂිකව | මාසිකව 1,000.00 | 30,000.00 | 5,700.00 | 171,000.00 | 171,000.00 | 2044.07.27 |
| 3 | පොදු වෙළඳපල- 1 වන අදියර- 30 | එම්.එම්.ඥාණතිලක මයා | 2001.07.17 | වසර 05 | මාසිකව 150.00 | 4,500.00 | 2,500.00 | 75,000.00 | 300,000.00 | 2046.03.30 |
| 4 | පොදු වෙළඳපල- 2 වන අදියර- 4 | එම්.යූ.එම්.මුනව්වර් මයා | 2011.11.09 | වසර 03 | 512,570.70 | 128,142.67 | 10,400.00 | 312,000.00 | 312,000.00 | 2041.11.08 |
| 5 | පොදු වෙළඳපල- 2 වන අදියර - 6 | ජේ.නජිම්දීන් මයා | 2000.10.01 | වසර 05 | 175,501.00 | 43,875.25 | 9,600.00 | 288,000.00 | 288,000.00 | 2030.09.30 |
| 6 | පොදු වෙළඳපල- 2 වන අදියර -12 | කේ.එම්.සුමේධ බණ්ඩාර මයා | 2019.06.19 | කාලයක් සඳහන් නැත | 150,500.00 | 37,625.00 | 7,500.00 | 225,000.00 | 225,000.00 | 2049.06.18 |
| 7 | පොදු වෙළඳපල- 2 වන අදියර -14 | වයි.එල්.එම්.හාරිස් මයා | 2000.12.30 | වසර 04 | 153,750.55 | 38,437.63 | 7,500.00 | 225,000.00 | 225,000.00 | 2030.12.29 |
| 8 | පොදු වෙළඳපල- 2 වන අදියර -15 | එන්.පි.එම්.සිරාජ් මයා | 2014.10.13 | වාර්ෂිකව | 151,270.50 | 37,817.62 | 7,000.00 | 210,000.00 | 210,000.00 | 2044.10.12 |
| 9 | නව පළමු වෙළඳ සංකීර්ණය - පළමු මහල - 3 | ඒ.එච්.එම්.රමීස් මයා | 2017.10.02 | කාලයක් සඳහන් නැත | 1,600,000.00 | 400,000.00 | 7,900.00 | 237,000.00 | 400,000.00 | 2047.10.01 |
| 10 | නව පළමු වෙළඳ සංකීර්ණය -බිම් මහල -7 | ජී.ජී.ඉෂාන් වීරසිංහ මයා | 2024.01.01 | වාර්ෂිකව | 2,550,700.00 | 637,675.00 | 6,500.00 | 195,000.00 | 637,675.00 | 2054.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | නව පළමු වෙළඳ සංකීර්ණය -බිම් මහල -3 | ඒ.ආර්.ඒ.අලි සාබිර් මයා | 2015.05.13 | කාලයක් සඳහන් නැත | 420,000.00 | 105,000.00 | 7,300.00 | 219,000.00 | 219,000.00 | 2045.05.12 |
| 12 | නව දෙවන වෙළඳ සංකීර්ණය - පළමු මහල -4 | එන්.පී.සුනිල් මයා | නැත | නැත | 2,202,000.00 | 550,500.00 | 6,300.00 | 189,000.00 | 550,500.00 | ❖ 2047.10.05 |
| 13 | නව දෙවන වෙළඳ සංකීර්ණය - බිම් මහල -9 | එම්.බී.එම්.මර්ෂුක් මයා | 2017.10.12 | වසර 02 | 3,600,000.00 | 900,000.00 | 9,100.00 | 273,000.00 | 900,000.00 | 2047.10.11 |
| 14 | නව දෙවන වෙළඳ සංකීර්ණය - පළමු මහල 15 | පී.බී.ටී.කෝසල කුමාර ද සිල්වා මයා | 2020.09.15 | කාලයක් සඳහන් නැත | 760,500.00 | 190,125.00 | 5,850.00 | 175,500.00 | 190,125.00 | 2050.09.14 |
| 15 | නව පළමු වෙළඳ සංකීර්ණය -බිම් මහල - 6 | එම්.එම්.ඥාණතිලක මයා | 2020.12.31 | කාලයක් සඳහන් නැත | 380,000.00 | 95,000.00 | 6,600.00 | 198,000.00 | 198,000.00 | 2050.12.30 |
| 16 | නව පළමු වෙළඳ සංකීර්ණය -බිම් මහල - 4 | ජී.ඩබ්.එස්.ලලිත් විතාරණ මයා | 2021.08.02 | කාලයක් සඳහන් නැත | 420,000.00 | 105,000.00 | 7,200.00 | 216,000.00 | 216,000.00 | 2051.08.01 |
| 17 | නව දෙවන වෙළඳ සංකීර්ණය - පළමු මහල - 11 | කේ.එම්.අජිත් කුමාර අබේරත්න මයා | 2017.10.03 | කාලයක් සඳහන් නැත | 1,677,000.00 | 419,250.00 | 6,300.00 | 189,000.00 | 419,250.00 | 2047.10.02 |
| 18 | නව පළමු වෙළඳ සංකීර්ණය - පළමු මහල - 6 | ටී.ඩී.යු.අබේගුණවර්ධන මයා | 2017.10.03 | කාලයක් සඳහන් නැත | 1,655,000.00 | 413,750.00 | 5,900.00 | 177,000.00 | 413,750.00 | 2047.10.02 |

❖ ටෙන්ඩර් පිරිනමන ලද 2017.10.06 දිනය පදනම්ව ඉතිරි වසර 30ක උපරිමය කාලය සලකා ඇත.

**අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 12.30 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.